021

සියලු හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 09 - ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව

නම/විභාග අංකය :- ........................................................................ කාලය: පැය 02 යි.

I කොටස

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 20 තෙක් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) වේදිකා නාට්‍ය නිර්මාණයක මුල් ම පියවර වන්නේ,

(1) ආනුශාංගික අංග නිර්මාණය කිරීම යි. (2) නාට්‍ය පෙළ රචනය යි.

(3) නළුවරණය පැවැත්වීම යි. (4) රඟහලක් තෝරා ගැනීම යි.

(02) බාහිර සමාරෝපය සඳහා භාවිත ද්‍රව්‍යයක් නොවන්නේ,

(1) අංග රචනය (2) සිතුවිලි (3) රංගාලෝකය (4) සංගීතය

(03) රංගනයේ දී සාත්වික භාව නිරූපණය සඳහා වැදත් වන රංග අභ්‍යාසයක් වන්නේ,

(1) දර්පණ තල අභ්‍යාස (2) ඇවිදීමේ අභ්‍යාස

(3) කටහඬ අභ්‍යාස (4) සන්වේදන අභ්‍යාස

(04) චරිතයක විවිධ පැතිකඩ,

(1) භූමිකා නම් වේ. (2) ගැටුම නම් වේ.

(3) සමාරෝපය නම් වේ. (4) චරිත නිරූපණය නම් වේ.

(05) මින් නාට්‍ය පිටපතක ඇතුලත් නොවන්නේ,

(1) ගැටුම (2) තේමාව (3) චරිත (4) රූපණය

(06) A - ඒ උනාට මිනිහෝ නිදිමතේ පුළුවන් ද නැමදාම රටක් පාලනය කරන්න.

B - මෙලොව දී තව තව ලැබෙන්න. එලොව දී දුක නැතුව ඉන්න.

ඉහත A හා B දෙබස් ඛණ්ඩ අයත් නාට්‍යයන්හි ශෛලීන් පිළිවෙලින් දක්වෙන්නේ,

(1) ලෝකධර්මී, මිශ්‍ර (2) ලෝකධර්මී, නාට්‍යධර්මී

(3) නාට්‍යධර්මී, මිශ්‍ර (4) නාට්‍යධර්මී, ලෝකධර්මී

(07) රංග ක්‍රීඩාවල යෙදීමෙන් නළුවාට ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,

(1) ජය පරාජය එක ලෙස විඳ ගැනීමේ හැකියාව. (2) සාමූහිකත්වය ඇති වීම.

(3) නායකත්වයට හුරු වීම. (4) ක්‍රියාශීලී බව නැති වීම.

(08) ශිථිලකරණය යනු,

(1) සිරුරේ අංග සිසිල් කිරීම යි. (2) මනස සැහැල්ලු කිරීම යි.

(3) සිරුරේ අඟ සැහැල්ලු කිරීම යි. (4) සිරුර හැඩ ගැන්වීම යි.

(09) ට්‍රිලීෂියා ගුණවර්ධන ශිල්පිණිය රඟ පෑ නාට්‍ය දෙකක් වන්නේ,

(1) මනමේ, හස්තිකාන්ත මන්තරේ (2) මමත් මිනිහෙක්, ජනේලය

(3) සිංහබාහු, හරි ම බඩු හයක් (4) මායාදේවී, රත්තරං

(10) 2017 වසරේ රාජ්‍ය නාට්‍ය උළෙලේ ළමා නාට්‍ය ලෙස සම්මාන දිනා ගත්තේ,

(1) මං මලත් හිටියා (2) හැකුව බැරි මිනිහෙක්

(2) රජා මං වහලා (4) මායා බිත්ධන

- A කොටසට සුදුසු පදය B කොටසින් තෝරා යා කරන්න.

| A කොටස | B කොටස |
|---|---|
| (11) ජනේලය | • නාට්‍යධර්මී |
| (12) රාස්සයකු ගමට ඇවිල්ලා | • කවිහඬ |
| (13) ශරීරයේ නම්‍යශීලී බව | • ලෝකධර්මී |
| (14) පනස්පාව හා නම් ප්‍රපාත | • රූපණය |
| (15) මනමේ | • රංග ක්‍රීඩා |

- 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට පහත ඡායාරූප ඇසුරු කර ගන්න.


A


B


C


D

(16) B ඡායාරූපයෙන් දැක්වෙන්නේ,

(1) ළමා නාට්‍ය නිර්මාණ ශිල්පිනියකි. (2) සංගීත අධ්‍යක්ෂවරියකි.

(3) ප්‍රකට නත් නැටුවරියකි. (4) නර්තන ශිල්පිනියකි.

(17) A ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු විසින් නිර්මාණය කරන ලද මාර්ගා රංගයට අයත් නාට්‍ය දෙකක් වන්නේ,

(1) සිංගුත්තර, මධුර ජවනිකා (2) මධුර ජවනිකා, ආනන්ද ජවනිකා

(3) නරිබෑණා, බක්මහ අකුණු (4) බක්මහ අකුණු, ආනන්ද ජවනිකා

(18) "මුදු පතුල පට ඉඳලා" යන ගීතය ඇතුළත් නාට්‍ය නිර්මාණය කරන ලද නාට්‍යකරු වන්නේ,

(1) A (2) B (3) C (4) D

(19) A ඡායාරූපයෙන් දැක්වෙන්නේ,

(1) ජයලත් මනෝරත්න මහතා. (2) දයානන්ද ගුණවර්ධන මහතා.

(3) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා. (4) සුගතපාල ද සිල්වා මහතා.

(20) C ඡායාරූපයෙන් දැක්වෙන්නේ,

(1) නිශ්ශංක දිද්දෙණිය මහතා. (2) මාර්ක් ඇන්ටනි ප්‍රනාන්දු මහතා.

(3) ජයලත් මනෝරත්න මහතා. (4) එඩ්මන්ඩ් විජේසිංහ මහතා.

(ලකුණු 2×20 = 40)

## II කොටස

- "අ" කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- "ආ" කොටසින් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

### <u>"අ" කොටස</u>

(01) (තොටිච්චිල්ලෙන් වටපිට බලමින් සිට තරඟත්තාත් දෙස බලමින්)

"අනේ, මට නං තේරෙන්නෙ නෑ මේ මිනිහගෙ කපටි කතාවලට ළමයා හොඳට ම රැවටිලා."

(i) මෙම සංවාද ඛණ්ඩය අයත් නාට්‍ය කුමක් ද? (ලකුණු 01)

(ii) මෙම නාට්‍යයේ අධ්‍යක්ෂවරයා නම් කරන්න. (ලකුණු 02)

(iii) මෙම නාට්‍ය සඳහා පාදක වූ කතා පුවත කුමක් ද? (ලකුණු 01)

(iv) මෙම නාට්‍ය වේදිකා නාට්‍යයක් ලෙස මුලින් ම රංග ගත කළේ කුමන වර්ෂයේ ද? (ලකුණු 02)

(v) මෙම නාට්‍ය නිර්මාණය කර ඇති ශෛලිය කුමක් ද? (ලකුණු 02)

(vi) ඉහත දෙබස් ඛණ්ඩයේ දක්වෙන රංග විධානය ලියන්න. (ලකුණු 01)

(vii) මෙම දෙබස් ඛණ්ඩය පවසන්නේ කවුරුන් විසින් ද? (ලකුණු 01)

(viii) මෙම නාට්‍යයේ මුලින් ම වේදිකාවට පැමිණෙන චරිතය කුමක් ද? (ලකුණු 01)

(ix) මෙම නාට්‍යයේ පසුතල නිර්මාණය විස්තර කරන්න. (ලකුණු 02)

(x) මෙම නාට්‍යයෙන් සමාජයට ලබා දෙන ආදර්ශ දෙකක් ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු = 15)

### <u>"ආ" කොටස</u>

(02) (i) ආනුශංගික කලාවන් යන්න හඳුන්වන්න. (ලකුණු 04)

(ii) අංග රචනය තුළින් නාට්‍යයකට ලැබෙන ප්‍රයෝජන කවරේ ද? (ලකුණු 04)

(iii) නාට්‍යයක වේශභූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(03) (i) බෞද්ධ පූජාකර්ම 04ක් නම් කරන්න. (ලකුණු 04)

(ii) එක් බෞද්ධ පූජාකර්මයක් සිදු කරන ආකාරය කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) බෞද්ධ පූජාකර්මයන් හි දකිය හැකි නාට්‍යමය ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 07)

(04) (i) ගැටුම යන්න හඳුන්වන්න. (ලකුණු 04)

(ii) ගැටුමෙහි ප්‍රභේද නම් කරන්න. (ලකුණු 04)

(iii) කදා වළලු නාට්‍යයේ ගැටුම් අවස්ථා විස්තර කරන්න. (ලකුණු 07)

(05) (i) ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් දෙදෙනකු බැගින් නම් කරන්න. (ලකුණු 04)

(ii) ඔවුනගේ නාට්‍ය නිර්මාණ දෙක බැගින් ලියන්න. (ලකුණු 04)

(iii) ඉන් එක් නාට්‍යකරුවකුගෙන් සිදු වූ සේවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)